# රුහුණ විශ්වවිද්‍යාලය
## 2022/2023 වර්ෂය සඳහා ආපනශාලා පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන කැඳවීම

රුහුණ විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයට 2022/2023 වර්ෂ තුළදී ආහාරපාන සැපයීම සඳහා ***සේවක ආපනශාලා අංක 01*** පවත්වාගෙන යාමට සුදුස්සෙක් තෝරා ගැනීම සඳහා පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් 2022.03.15 දින ප.ව. 2.00 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

__ලංසු පත්‍ර ලබා ගැනීම__

ආපසු නොගෙවන රු. 1000/- ක මුදලක් ලංසු ගාස්තු ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත නියෝජ්‍ය ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් අදාල විස්තර හා ලංසු පත්‍රිකා 2022.03.14 දින ප.ව. 3.00 දක්වා (කාර්යාල වේලාවන්හිදී) ලබාගත හැකිය. විශ්වවිද්‍යාලය තුල ආපනශාලා පවත්වාගෙන යාමට නුසුදුසු බවට විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇති කිසිදු ආයතනයකට හෝ පුද්ගලයකුට ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

__ලංසු භාර ගැනිම__

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු "මුල් පිටපත" සහ "අනු පිටපත" වෙන වෙනම ලියුම් කවර දෙකක බහා එම කවරවල උඩ කෙළවරේ **"සේවක ආපනශාලා අංක 01 සඳහා මිල ගණන් කැඳවීම - 2022/2023"** යනුවෙන් පැහැදිලිව සඳහන් කර 2022.03.15 වන දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, සාමාන්‍ය පාලන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර"** යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් එම ලිපිනයේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති අංක: 01 ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැකිය. ප්‍රමාද වී හෝ අසම්පූර්ණව ලැබෙන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

__ලංසු විවෘත කිරීම__

2022.03.15 වන දින ප.ව. 2.00 ට ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අංක: 041-2222681/82 දිගුව 12014 යන දුරකථන මඟින් නියෝජ්‍ය ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන ගෙන් විමසා දැන ගත හැකිය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව, සාමාන්‍ය පාලන අංශය,
රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම. මාතර.
2022.03.02